පොදු චක්‍රලේඛ ලිපි අංක: 01-24/2026

මගේ අංක 07/D/05/01/06-3/2025
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
2026.07. 14 දින

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති
සියලුම ආයතන සහ රෝහල් ප්‍රධානීන් වෙත

<u>සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්)</u>

<u>තනතුරට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025</u>

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරුවල කුසලතා පදනම මත පවතින පුරප්පාඩු 03 පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අ) මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර " ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පාලන 07 ශාඛාව, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08", වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025 " යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය.

(ආ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.08. 10 වේ.

**සටහන :** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**01. බඳවා ගැනීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව මගින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

**02.** සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් වර්ෂයක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

**03.** වැටුප් පරිමාණය :

මෙම තනතුරට 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව (MT 08-2025) රු.86,800-10x2,420-8x2,940-134,520ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. මෙම වැටුප උපලේඛන II හි සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.

**04.** පළපුරුද්ද :

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ I වන ශ්‍රේණියේ වෛද්‍ය සැපයීම් සහකාරවරයකුවීම හෝ I වන ශ්‍රේණියේ ඖෂධවේදියකු වීම.

**05.** වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. සේවය ස්ථිර කර තිබිය යුතුය.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කල යුතුය.
v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
vi. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්නතම වසර පහක (05) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. සම්මුඛ පරීක්ෂණය:

6.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| **1.** අධ්‍යාපන සුදුසුකම්<br>(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක ඖෂධවේදී විශේෂ උපාධියක් (B.Pharm./B.Sc.Phamacy) හෝ වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් (B.Sc.M.L.S.)<br>හෝ<br>(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක ඖෂධවේදය, වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක හෝ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංඛ්‍යානය, ජීව විද්‍යාව යන විෂයයක් ඇතුළත් විද්‍යාවේදී (B.Sc.) සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ ප්‍රථම හෝ දෙවන පෙළ සාමාර්ථයක්<br>හෝ<br>(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංඛ්‍යානය, ජීව විද්‍යාව, ඖෂධවේදය යන විෂයයක් ඇතුළත් විද්‍යාවේදී (B.Sc.) සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ එම විෂයයක හෝ කළමනාකරණ විෂයයක පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්<br>හෝ<br>(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයක රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංඛ්‍යානය, ජීව විද්‍යාව, ඖෂධවේදය යන විෂයයක් ඇතුළත් විද්‍යාවේදී (B.Sc.) සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ රජයේ/ රජයට අනුබද්ධ ආයතනයක ඖෂධවේදය, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදය හෝ සැපයුම්/ මිලදී ගැනීම් හා භාණ්ඩ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)<br>සටහන :<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2025 හි විධිවිධාන ප්‍රකාරව නිලධරයා විසින් අදාළ උපාධි සුදුසුකම්වල සත්‍යතාවය පිළිබඳව අදාළ විශ්වවිද්‍යාලයෙන් සත්‍යාපනය කරගත යුතු වේ. | 15 |
| **2.** අදාළ ශ්‍රේණියේ පළපුරුද්ද<br>වෛද්‍ය සැපයීම් සහකාර සේවයේ (පෙර ගබඩා භාරකාර සේවයේ) I වන ශ්‍රේණියේ / I වන පන්තියේ සම්පූර්ණ කළ සේවා කාලය හෝ ඖෂධවේදී සේවයේ I වන ශ්‍රේණියේ / I වන පන්තියේ සම්පූර්ණ කළ සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින් වසර 10ක් සඳහා (උපරිම සුදුසුකම් වශයෙන් ලකුණු 50) | 50 |
| **3.** අදාළ ක්ෂේත්‍රයේ අතිරේක වෘත්තීය සුදුසුකම්<br>a) රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් වෛද්‍ය සැපයීම් ගබඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (ලකුණු 20)<br>b) රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් වෛද්‍ය සැපයීම් ගබඩා කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (ලකුණු 15)<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 20 |

| | |
|---|---|
| **4.** පරිගණක හැකියාව<br>I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා (ලකුණු 10)<br>II. රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ පැය 1500 නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (ලකුණු 05)<br>III. රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (පැය 360 නොඅඩු) (ලකුණු 02) | 10 |
| **5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය** | 05 |
| **මුළු ලකුණු** | 100 |

**07.** ඉල්ලුම් පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසි වල සකස් කල යුතුය. අංක 01 සිට 09 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, අංක 10 (III) වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද වන ලෙස ගෙන මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කළ යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**08.** සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09.** මෙම පොදු චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**10.** මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ -10.
දිනය :-2026.07.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.